# සිද්ධි SIDDHI

අතුල කල්දේමුල්ල ලියයි

## සිත්තර වසන්තය



පසුගිය සති කිහිපයේ මුහුණු පොතේ සැරිසැරූ අපූරු වූ චිත්‍රයක් පිළිබඳව මගේ මතකයට නැගේ. මේ චිත්‍රය කලාත්මකව, නියමාකාරයට කර තිබුණේ වෙළඳ ප්‍රචාරක මාධ්‍යයේ නිර්මාණ ශිල්පියෙකු, චිත්‍ර කතා හා ආලේඛ්‍ය කලාවට අති දක්ෂයෙක්.

ඔහු වසන්ත ශ්‍රීනාත් කුරුකුලසූරියයි. මේ ආලේඛ්‍ය කලා නිර්මාණයේ හිමිකරුවා වූයේ පොතපත, ගීයට දක්ෂම දැක්වූ ප්‍රවීණයකු වන "සන්නස" පුවත්පත හා සබැඳි ජගත් ජේ. එදිරිසිංහයන්.

වසන්ත ශ්‍රීනාත් ගෙන් මේ ලැබුණ සිහිවටනය ජගත්ට බොහොම වටිනවා. ඒ වගේම තමා මා



දන්නවා මෙවැනි චිත්‍රයක් වසන්තගෙන් ලබා ගැනීමත් දුෂ්කර වූ කාර්යයක්. බොහෝ වේලාවට ඔහු කාර්ය බහුලයි. ඒ වගේම තමා කැමැත්තකුත් තියෙන්නට ඕනෑ සම්පතමයෙන් අඳින්නට. ජගත් මා හා පැවසුවේ වසන්ත මේ චිත්‍රය ඉතා ඉක්මනි න් නිමාකළ බවයි.

80 දශකයේ තමයි වසන්ත ශ්‍රීනාත් මාත් සමග "ග්‍රාන්ට්" ප්‍රචාරක ආයතනයේ රැකියාවේ යෙදෙන්නේ. බොහොම නිහතමානී පුද්ගලයෙකු වූ ඔහු ඔහුගේ දක්ෂතාව ගැන අධිතක්සේරුවේ යෙදෙන්නට, පුරසාරම් දොඩන්නට, තරඟකාරීත්වයේ යොදෙන්නට කිසි දිනෙක බැලුවේ නැහැ.

ඔහුගේ දක්ෂතාවට උපරිම අගයීම ඔහු සොයා ආවා. පසෙක තමුන් ග්‍රාන්ට් ප්‍රචාරකායතනයෙන් ඈවී මා ෆිනික්ස් වෙළඳ ප්‍රචාරක ආයතනයට පැ-වියට පැමිණීමත් සමග හිතවතුන් කිහිප දෙනෙකුගේ දුරස්ථභාවය සිදුවුනා. ඔවුන් බොහෝ දෙනා මුණගැසුණේ විටින් විට. වසන්ත ශ්‍රීනාත්ටත් මටත් වන්නේ එවැනි සිදුවීමක්. පසුව අප දෙ-දෙනාම මෙරටට පැමිණියත් වසර ගණනාවකට

පසුව තමා කතාබහක යෙදෙන්නේ. මා හිතන පරිදි අවු 25 කින් පමණ.

ජගත්ට ඇඳි චිත්‍රය මා දුටු මොහොතේම ජගත්ගෙන් දුරකථන නොම්මරය රැගෙන ඇමතුමක් දුන්නා. ඔහුට සුබ පැතුවේ මෙහි අලංකාරය කියන්නටත් එක්ක. ඇමතුමේ අනෙක් කොණෙන් වසන්තය හඬක් එක්ක කියා-වුනේ "හොඳ, අහලා පුරුදු හඬක්. මේ අතුලගේ.. සිනාමුසු හඬකින්. ඉතිං කො-හොමද මචං.... යන්න ඇසෙනවිට පෙරදු බැඳී තිබෙන්නකමට



වාගේ දුටුවා මේ චිත්‍රයම තමා බො-හෝ දේ වලට පාවිච්චි වන්නේ එය එතරම් සුන්දර නිර්මාණයෙකි.

මේ ගැන වසන්තගෙන් ඇහුවාම ඔහු හිනාවෙලා මෙන්න මේ වගේ වෙනස්ම ආකාරයේ කතාවක් මට කියන්නේ .







" මෙහෙම මම ඔස්ට්‍රේලියාවට එන්න ඉන්න හදිසියේ ඔක්කොම ගිහ දේවල් පැක් කරලා උන්නු දවසක්. මෙන්න හදිසියේම අපේ ලැජි මිත්‍ර උවිඳු (කුරුකුලසූරියා) මට ඇවිල්ලා කිව්වා වසන්ත අයියා මාර හදිසියි දැන්මම ඔයා මේ වැඩේ කරන්න ඕනෑ කියලා. ලසන්ත වික්‍රමතුංග ඝාතනය කරලා. මේ වෙලේ පාවිච්චි කරන්න මුහුණේ චිත්‍රයක් ඇඳලා දෙන්න කියලා. මම කොහොමද කරන්නේ උවිඳු ඔක්කොම පැක් කරලා. අනික අනික චිත්‍ර අඳින බඩු ඇමිනමී කොහෙද දන්නේ නෑ. මටනම් අඳින්න බැරිවෙයි කියලා කිව්වා. කොහෙද ඉතිං අහනවායැ මට බලකරලාම උන්නා කොහොමහරි ඇඳලා දෙන්නට කියලා. වටපිට බලනකොට තිබුණේ පුතේ ස්කූල් බෑග් එක. ඒක ඇතුලේ තිබුණ පාට පැන්සල්, කාබන් පෑන්, ඔය ටික අරගෙන පුළුවන් විදියට කරා. මා හිතන

පියඹා ගිය ගියේ නො-පොහොසින්.

මට මේ අතර තුරේ මතකයට ආවා කියැදෙනෙකු මුහුණු පොතේ සඳහන් කර තිබූ සටහනක්. වසන්ත ශ්‍රීනාත් තමයි බොහොම නැගෙන පළවන එවකට සන්ඩේ ලීඩර් පුවත්පතේ කතෘ ලසන්ත වික්‍රමතුංග යන්නේ රුව ඇඳ තිබුණේය යනවත.

මාත් අන්තර්ජාලයේ කිහිප තැනකම

අතරින්සන්වයෙන් අඳින්න ඕනු නෑ. දැන් මේ ළමා උපකරන වලින් තමා මේ චිත්‍රය අඳින්නේ කෙසේ හෝ ඉවර කරගන්නාම උවිඳු රූපය හරි අගේ කරා.

මට ඔයගේ නම ගහන්න කියලා වගේ, මං කිව්වා මේකට ඔයගේ නම ඕනෑ නෑ. හොඳ එකක් මට ඕනෑ විදියට ඇන්දම ගහන්නම් කියලා. තවත් මොනවද හොඳ, මම ඔයගේ නම ගහලා දෙනවා කියලා උවිඳු එයාගේ නම ගහගෙන ගියා. මාත් හිනා වෙවී බලන්දන්නා මේකා මේ කරන වැඩ ගැන. බොහොම ඉක්මනින් වෙන් එකෙන් පියඹාගෙන ගිය උවිඳු ඇසිල්ලෙන් ආයෙත් එකෙන් කරවා ගෙන අපේ ගෙදරටම ඇවිත්. ඇයි මොකද උවිඳු ඒ පාර... මොකක් ද ප්‍රශ්නේ.

නෑ....මං මේ ඔයගේ නම මකාගෙන යන්න ඕනේ. මට පස්සේ මතක් වුනේ. මාර කේස් එකනේ උඹ නං ඔස්ට්‍රේලියා යයි. අන්තිමේදී මෙතෙනට එන අය අඳින්න කියලා වැඩ අරන් එතකොට බෝරුව අපේ මාට්ටු. මං මේකේ ඔයගේ නම මකලා දෙනවා.

වසන්ත ඒ කියූ කතාවේ ගැබ්වූ හාස්‍යය වගේම අදටත් බොහෝ තැන්වල පාවිච්චි කරන ලසන්ත වික්‍රමතුංගයන් ඇඳි සුන්දර රුවේ පසු පස සැඟවූ මතක කතාව වසන්ත මට මතක් කර දුන්නේ "උඹේ ඔය සිද්ධි අතරට වෙනත් හොඳ සිද්ධියක්" කියායි.

